# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2006 අංක 26 දරන ටී. බී. තෙන්නකෝන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 අගෝස්තු මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.75 යි.** තැපැල් ගාස්තුව : රු. **5.00** යි.

## 2006 අංක 26 දරන ටී. බී. තෙන්නකෝන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 21 වන දින]

එල්. ඩී. ඕ. (අයි. එන්. සී.) 20/2005.

### ටී. බී. තෙන්නකෝන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ටී. බී. තෙන්නකෝන් පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ දඹුල්ලෙහි පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම්කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2006 අංක 26 දරන ටී. බී. තෙන්නකෝන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ටී. බී. තෙන්නකෝන් පදනමේ දැනට සාමාජිකයන්ව සිටින හා සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන ) "ටී. බී. තෙන්නකෝන් පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද, එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. ටී. බී. තෙන්නකෝන් පදනම.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) අධ්‍යාපන පහසුකම් නොමැති දුප්පත් ළමයින් සහ තරුණ පිරිස් සඳහා අධ්‍යාපන කටයුතු සහ පෙර පුහුණු කටයුතු සංවිධානය කිරීම, පවත්වාගෙන යාම සහ වැඩි දියුණු කිරීම ;

(ආ) ක්‍රීඩා, පරිගණක හා ජනසන්නිවේදන ක්ෂේත්‍රවල ප්‍රාග් වෘත්තීය අධ්‍යාපන පුහුණුව සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදීම ;

(ඇ) දිළිඳු ශිෂ්‍යයන්ට ඉංග්‍රීසි, දෙමළ සහ වෙනත් භාෂාවන් ඉගැන්වීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ සහ විදේශවල පර්යේෂණයන් සහ අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා සුදුසු සිසුන්ට ශිෂ්‍යත්ව, ණය සහ ආධාර ප්‍රදානය කිරීම මගින් ඔවුන්ට සහාය සැලසීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස්වල සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පුස්තකාල, ලේඛන ආරක්ෂකාගාර සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඊ) දිවංගත ටී. බී. තෙන්නකෝන් මැතිතුමා අනුස්මරණය කිරීම අවිච්ඡින්නව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ මධ්‍යස්ථානයක් සහ කෞතුකාගාරයක් පිහිටුවීම ;

(උ) අනාථ, ආබාධිත, මහළු, ගිලන් සහ අවතැන් වූ පුද්ගලයන්ගේ සුභ සාධනය සහ පුනරුත්ථාපනය සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඌ) පොදු ජන සුභ සාධනයට තරුණ ශ්‍රමය යොදවා ගැනීම ;

(එ) නායකත්වය සඳහා තැනැත්තන් පුහුණු කිරීම ;

(ඒ) ගොවීන් දිරිගැන්වීම හා තරුණ ගොවි සංගම් ඇති කිරීම ;

(ඔ) සම්මන්ත්‍රණ, සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීම මගින් ජාතික සමගිය වැඩිදියුණු කිරීමේ කාර්යයෙහි නියැලී සිටින පුද්ගලයන් දිරිමත් කිරීම ; සහ

(ඕ) සම්මාන, ත්‍යාග, ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම මගින් ජාතික සමගිය කෙරෙහි දායකත්වය ලබා දුන් විශිෂ්ඨ පුද්ගලයන් සැමරීම හා ගෞරව කිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම හෝ ගැනීම, බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට, කෙළින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින්, ත්‍යාග, පරිත්‍යාග සහ රික්ථවරණ භාර ගැනීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සලකනු ලබන ආකාරයකට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම ;

(ඉ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ඊ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපි ලේඛණ පළ කිරීම හෝ පළ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම, ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ;

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සහ ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සංස්ථාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, උප ලේකම්වරයා, භාණ්ඩාගාරික සහ වෙනත් සාමාජිකයන් නවදෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරූවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, එහි බලතල, චර්යාව සහ කාර්යය, මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුරකාලය සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පුරප්පාඩු පිරවීම;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය හා කර්තව්‍ය;

(ඉ) මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ඒ රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

7. සභාපතිවරයා ද ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ද ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

9. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලද හෝ මින් මතු භාර ගනු ලබන ත්‍යාග, රික්ථවරණ පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

10. (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය;

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය;

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනවලින් යම් ආයතනයක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

**12**. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුනහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13**. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.